නිපුණතාවය - පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම - පාරිභාරික අවශ්‍යතා සඳහා නව්‍යතාවයකින් යුතු සැලසුම් චිත්‍රණය කරයි.

ක්‍රියාකාරකම් - නවතාවයකින් යුතු වෙස් මූහුණක් නිර්මාණය කරමු.

පැවරුම - පහත පියවරානුකූලව ක්‍රියාකාරකමෙහි නියැලෙන්න.

පියවර 1 - ස්මාර්ට් ජංගම දුරකථනය, රූපවාහිනිය වැනි ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් උපයෝගිකරගෙන දේශීය මෙන්ම විදේශීය විවිධ සංස්කෘතික උත්සවවල භාවිතා වන වෙස් මූහූණු ඇතුලත් වීඩියෝ පටයක් රූප රාමු නරඹන්න.

පියවර 2 - ඔබ නැරඹූ වීඩියෝ පටයේ හෝ රූප රාමුවල ඇතුළත් වූ වෙස්මුහුණු පිළිබඳ සියුම්ව අධ්‍යයනය කරමින් එහි තානුම් මාධ්‍යය, භාවිතා වන අවස්ථාව, හැඟීම් ප්‍රකාශය, භාවිත කර ආකාරය ආදිය පිළිබඳව අවධානය යොමු කරන්න.

පියවර3 - අධ්‍යයනය මගින් ඔබලත් අත්දැකීම අනුව කවකටු, මිනුම් දඬු ආදිය භාවිතා කරමින් නවතාවයකින් යුතු වෙස්මූහූණක් සැලසුම් කරන්න.

පියවර 4 - ඔබ විසින් නිර්මාණය කළ වෙස් මූහුණ හැඟීම් ප්‍රකාශයවන (බය,සතුට,හාස්‍යය,දුක) ලෙස ගැලපෙන සේ වර්ණ කරන්න.

ඔබ විසින් සැලසුම් කළ වෙස් මූහුණ සරල පහසු මාධ්‍යයන් භාවිතයෙන් ප්‍රායෝගිකව නිර්මාණය කළ හැකි විය යුතුය.